# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/28 - 2020 අගෝස්තු මස 19 වැනි බදාදා - 2020.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44 (v)

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වූ නියමය

"ශ්‍රී නාරායන ධර්ම සංගම් කළම්බු ට්‍රස්ට්" යන භාරයේ භාරකරුවන්, එනම් :-

1. ක්‍රිෂ්ණන් ජයකුමාර්,
2. ගරු ආචාර්ය මාදම්පාගම අස්සජි තෙර,
3. ආචාර්ය අම්පලම් කන්දසාමි,
4. තෝප්පිල් සත්‍යපාලන් ප්‍රකාශ්,
5. අභිරාමිපිල්ලෙයි කයිලාසපිල්ලෙයි,
6. ජනාධිපති නීතිඥ රියෙන්සි ඇනිසිටස් ප්‍රනාන්දු අර්සකුලරත්න,
7. ඇන්තනි රත්දෙව් දිනේන්ද්‍ර ජෝන්.

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ;

ඉහත කී ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර -

(අ) කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, සරවනන් නීලකන්දන් විසින් සහතික කරන ලද 2019 ජූලි මස 27 සහ 2019 අගෝස්තු මස 5 වැනි දිනැති අංක 169 දරන භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "ශ්‍රී නාරායන ධර්ම සංගම් කළම්බු ට්‍රස්ට්" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යැයි ද ;

1A - G 032698 — 46 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගැනීම, භාරගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද ; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩුවල දී සහ නඩු කටයුතුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට, උත්තර දීමට හා විත්තිවාචක ඉදිරිපත් කිරීමට ද ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබීමට, උත්තර දෙනු ලැබීමට හා විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයට කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

**නිමල් සිරිපාල ද සිල්වා,**
අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2020 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

09 - 58

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.